# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2045/17 - 2017 නොවැම්බර් මස 15 වැනි බදාදා - 2017.11.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2009 මැයි මස 28 වන දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද (2017 ජූලි මස 19 වැනි දින අංක 2028/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඉහත කී නියමයේ උපලේඛනයේ I වන තීරයේ දක්වෙන "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන සටහනට අනුරූපව එකී උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "12. මානව විද්‍යා අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම, පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් :-

"13. දර්ශනය හා මනෝවිද්‍යාව අධ්‍යයන අංශය"

(2) ඉහත කී නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යවහාර විද්‍යා පීඨය" යන සටහනට අනුරූපව එකී උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන "9. සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය" යන සටහනට ඉක්බිතිව ම, පහත දැක්වෙන සටහන එකතු කිරීමෙන් :-

"10. ක්‍රීඩා විද්‍යා අධ්‍යයන අංශය".

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

11 - 1317


1A - PG 3760 — 508 (2017/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*